# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 අප්‍රේල් මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2021.04.15 දින නිකුත් කරන ලදී)

# හදිසි මහජන සෞඛ්‍ය

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම; මහජන සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමු කිරීමේ විශේෂිත ක්‍රියාමාර්ගයන් සම්මත කිරීම; සහ එයට සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 23.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# හදිසි මහජන සෞඛ්‍ය

**හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම; මහජන සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමු කිරීමේ විශේෂිත ක්‍රියාමාර්ගයන් සම්මත කිරීම; සහ එයට සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා වූ පනතකි**

**පූර්විකාව**

කෝවිඩ් 19 වසංගත තත්ත්වයක් ලොව පුරා ව්‍යාප්ත වෙමින් පවතින හෙයින් ද :

අනාගතයේ දී ඇතිවිය හැකි වෙනත් ඕනෑම වසංගතයකට එරෙහිව සටන් කිරීම පියවර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කළ යුතු තත්ත්වයක් ඇතිව තිබෙන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය**

1. මේ පනත 2021 අංක   දරන හදිසි මහජන සෞඛ්‍ය පනත ලෙස සඳහන් කළ හැකි වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන වගන්තිය ප්‍රකාරව සහතික කිරීමේ දිනයේ සිට එය බලාත්මක වේ.

## I වන කොටස

## සාමාන්‍ය

**හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම**

2. හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් හෝ ඊට ආසන්න තත්ත්වය සැලකිල්ලට ගෙන මහජන සෞඛ්‍ය අවශ්‍යතාවන් හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත උපදෙස් මත එය ඉටු කිරීම සුදුසු යැයි පාර්ලිමේන්තුව විසින් නිගමනය කරනු ලබන්නේ නම්, එකී යෝජනාවට සමස්ත සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් (පැමිණ නොසිටින අය ද ඇතුළත්ව) පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන්, හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් මතු වී තිබෙන බව ප්‍රකාශ කිරීම මෙම පනතේ II වන කොටසේ ප්‍රතිපාදන ප්‍රකාරව වහාම හෝ යෝජනාවේ දක්වා ඇති දිනයක දී, ශ්‍රී ලංකාව පුරා හෝ ශ්‍රී ලංකාවේ යම් කොටසක හෝ නිශ්චිතව දක්වා ඇති පරිදි ක්‍රියාත්මක වනු ඇත.

**දුරස්ථ රැස්වීම**

3. (1) වෙනත් ඕනෑම නීතියක කුමක් සඳහන් වුව ද, පාර්ලිමේන්තුව, අමාත්‍ය මණ්ඩලය, අධිකරණ, හදිසි මහජන සෞඛ්‍ය සභාව මෙතැන් සිට සපයා ඇති පරිදි සහ වෙනත් ඕනෑම ආයතන හා ආයතනවලට හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වය දී සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතාවයක් භාවිත කරමින් රැස්වීම් සහ සැසි පැවැත්විය හැකි ය.

(2) එවැනි සමකාලීන හෝ ආසන්න සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතාවක් සඳහා අවශ්‍ය සියලු තාක්ෂණික යටිතල පහසුකම් සහ මූල්‍ය සම්පත් අදාළ ආයතනය හා ආයතනනයන් වෙත ලබා දිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව පවත්වනු ලබන එවැනි රැස්වීම්වල සියලුම කාර්ය සටහන් පටිගත කර සහ විද්‍යුත් ආකාරයෙන් ගබඩා කර ඉන්පසු රැස්වීම්වලට අදාළ වන සාමාන්‍ය නීතිරීති වලට අනුකූලව පිටපත් කළ යුතු ය.

**දුරස්ථ සේවා**

**4.** (1) වෙනත් ඕනෑම නීතියක කුමක් සඳහන් වුව ද, හදිසි මහජන සෞඛ්‍යය කාලපරිච්ඡේදයක් තුළ සහ සාධාරණ මට්ටමකට වුව ද, ඕනෑම පුද්ගලයකුට අනන්‍යතා ලේඛන නිකුත් කිරීම හෝ අලුත් කිරීම ඇතුළු උප්පැන්න, මරණ හෝ විවාහ සහතික, නොපැමිණීමේ සහතික නිකුත් කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීමේ සේවාවන් ලබා ගැනීම සඳහා පුද්ගලයා භෞතිකව පැමිණීමට අවශ්‍ය නොවන, දුරස්ථ විද්‍යුත් මාර්ගයන්ගෙන්, ඕනෑම රාජ්‍ය සේවයකට ප්‍රවේශ විය හැකි විය යුතු ය.

(2) එවැනි දුරස්ථ විද්‍යුත් ප්‍රවේශයක් සඳහා අවශ්‍ය සියලු තාක්ෂණික යටිතල පහසුකම් සහ මූල්‍ය සම්පත් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති රාජ්‍ය සේවාවක් සපයන අදළ ආයතන හා ආයතනවලට ලබා දිය යුතු ය.

## II වන කොටස

### හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වය

**බෝවන රෝග නිශ්චය කිරීම**

**5.** මෙම පනතේ 2 වන වගන්තිය යටතේ සම්මත කර ඇති ඕනෑම යෝජනාවක් මගින් හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයකට මූලික හේතු වන බෝවන රෝගය නිශ්චය කරනු ලැබේ:

එසේ වුව ද, 2 වන වගන්තිය යටතේ කරන ලද යෝජනාවේ බෝවන රෝගයක් වැරදි ලෙස හඳුනාගෙන තිබේ නම්, එම යෝජනාවට අනුකූලව මෙම පනතේ II වන කොටස යටතේ ගෙන

ඇති ක්‍රියාමාර්ගවලට අගයතියක් නොවන පරිදි පාර්ලිමේන්තුව විසින් යෝජනාව සංශෝධනය කළ හැකි ය.

හදිසි මහජන සෞඛ්‍ය සභාව

**6.** (1) මෙම පනතේ 2 වන වගන්තිය යටතේ හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, හදිසි මහජන සෞඛ්‍ය සභාව නමින් (මින්මතුවට “සභාව” යැයි හැඳින්වෙන) ආයතනයක් පිහිටුවිය යුතු ය.

(2) සභාව සම්මත විය යුත්තේ -

(අ) සභාවේ සභාපතිවරයා වන ජනාධිපතිවරය;
(ආ) සභාවේ උප සභාපතිවරයා වන අග්‍රාමාත්‍යවරයා;
(ඇ) විපක්ෂ නායකවරයා;
(ඈ) පහත සඳහන් විෂයයන්භාර අමාත්‍යවරුන්:-

(i) සෞඛ්‍යය
(ii) සමාජ සුබසාධනය
(iii) පරිසර
(iv) ස්වදේශ කටයුතු
(v) විද්‍යා හා තාක්ෂණ;
(vi) ආරක්ෂක;
(vii) පොලීසිය;
(viii) මුදල්;
(ix) විදේශ කටයුතු;
(x) අධ්‍යාපන; හා
(xi) මෙම පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කර ඇති හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වය සඳහා පාර්ලිමේන්තුව විසින් අදාළ යැයි සැලකෙන විෂයයන් භාරව සිටින වෙනත් අමාත්‍යවරුන්;

(ඉ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්;
(ඊ) (3) වන උපවගන්තියේ සඳහන් පුද්ගලයින්.

(3) කථානායකවරයා, විපක්ෂ නායකවරයා සමඟ සාකච්ඡා කර විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පස් දෙනකු සභාවේ සාමාජිකයන් ලෙස නම් කළ යුතු ය.

(4) සභාවේ කාර්යයන් වනුයේ පහත අරමුණු උදෙසා ජාතික සැලැස්මක් හා වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමයි:-

(i) මෙම පනතේ 5 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති බෝවන රෝග හඳුනා ගැනීම සහ එයට මුහුණ දීම සඳහා සම්පත් ඵලදායී ලෙස භාවිත කිරීම;

(ii) මෙම පනතේ 5 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති එම බෝවන රෝගවලින් ආරක්ෂා වීමට මහජනතාවට උපකාර කිරීම සඳහා මහජනතාව දැනුම්වත් කිරීම සහ පුහුණුව වැඩි දියුණු කිරීම;

(iii) මෙම පනතේ 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හා සේවා අඛණ්ඩව සැපයීම;

(iv) අසරණභාවය හේතුවෙන් එම භාණ්ඩ හා සේවාවන්ට ප්‍රවේශ විය නොහැකි පුද්ගලයින් මෙම පනතේ 10 වන වගන්තියේ දක්වා ඇති භාණ්ඩ හා සේවා සැපයීම;

(v) සභාව විසින් තීරණය කරන පරිදි, මෙම පනතේ 5 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති බෝවන රෝග වැළැක්වීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලු ක්‍රියාමාර්ගයන් ගැනීම.

(5) (4) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඇති වන සියලු තාක්ෂණික යටිතල පහසුකම් සහ මූල්‍ය සම්පත් වෙන් කිරීමට සභාව විසින් පාර්ලිමේන්තුවට නිර්දේශ කළ යුතු ය.

(6) සභාව විසින් එහි රැස්වීම පැවැත්වීම හා එවැනි රැස්වීම්වල දී ව්‍යාපාර ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් වන ක්‍රියාපටිපාටිය නියාමනය කිරීම සඳහා නීති රීති සම්පාදනය කළ හැකිය.

(7) සභාවේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය එහි මුළු සාමාජිකයන්ගෙන් තුනෙන් එකක් විය යුතු ය.

හදිසි මහජන සෞඛ්‍ය තත්ත්ව කාලසීමාව

**7.** මෙම පනතේ II වන කොටසේ විධිවිධාන 2 වන වගන්තිය යටතේ යෝජනාවක් මගින් ඕනෑම දිනයක ක්‍රියාත්මක වන අවස්ථාවක, කලින් යෝජනාව අවලංගු කිරීම හෝ එම කාල පරිච්ඡේදය අවසන් වීමට පෙර තවත් යෝජනාවක් සම්මත

කිරීම යන පියවරයන්ට අගතියක් නොවන පරිදි, එම විධිවිධාන එදින සිට දින හැටක කාලයක් සඳහා ක්‍රියාත්මක වේ:—

හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වය අවසන් කිරීම

**8.** හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක් අවසානයකට එළඹෙන අවස්ථාවක, හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක දී හා ඒ අනුව නිකුත් කරන ලද පනතේ මෙම කොටස යටතේ ඇති ඕනෑම නියෝගයක්, මඟ පෙන්වීමක් හෝ තීරණයක් එම කාලසීමාව අවසන් වීමෙන් පසුව බල රහිත වේ.

මූලික අයිතිවාසිකම් තාවකාලිකව සීමා කිරීම

**9.** (1) ගැසට් පත්‍රයේ පළ කර ඇති නියෝගය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත උපදෙස් මත ඇමතිවරයාට දින දහහතරකට නොවැඩි කාලයක් සඳහා නිශ්චිතව දක්වා අති ආකාරයට එවැනි නියෝගයක:

(අ) මහජන රැස්වීම්;

(ආ) ආගමික ඇදහිලි, සැමරීම, පිළිපැදීම සහ ප්‍රසිද්ධියේ ඉගැන්වීම;

(ඇ) මෙම පනතේ 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා නොමැති රැකියාවක නිරත වීම;

(ඈ) වාසස්ථාන වෙත සහ ඉන් පිටතට ගමන් කිරීම;

(ඉ) ඕනෑම පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු උද්‍යානයක, පොදු විනෝද කටයුතු භූමියක, මුහුදු වෙරළක හෝ පොදු අවන්හලක, හෝටලයක, පොදු විනෝදාස්වාදක ස්ථානයක හෝ වෙනත් ඕනෑම පොදු ස්ථානයක සිටීම,

එවැනි නියෝගයකින් නිශ්චිතව දක්වා ඇති පරිදි නම් කරන ලද පුද්ගලයකු හෝ බලධාරියකු විසින් ලබා දෙන ලිඛිත බලපත්‍රයක් යටතේ හැර, තහනම් කිරීම හෝ සීමා කිරීම කළ හැකිය.

(2) 1 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ඕනෑම නියෝගයක් වහාම පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු අතර, එම යෝජනාව මගින් එම නියෝගය අවලංගු කළ හැකි ය.

(3) යෝජනාව මගින් පාර්ලිමේන්තුවට (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයක් තවත් දින දහහතරකට නොවැඩි කාලයක් සඳහා දීර්ඝ කළ හැකි අතර, ඒ හා සමාන යෝජනාවලින් පසුව එම නියෝගය දින දහහතරකට නොඉක්මවන කාලයක් සඳහා දීර්ඝ කළ හැකි ය.

(4) සාධාරණ හේතුවක් නොමැතිව (1) වන උපවගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝගයකට අනුකූලවීමට අපොහොසත් වන ඕනෑම අයෙකු වරදකට වැරදිකරුවෙකු වන අතර, ඔහු මෙම පනතේ 13 (1) (අ) වගන්තිය ප්‍රකාරව නිරෝධායනයෙහි යෙදවීමට බැඳී සිටී.

(5) මෙම වගන්තිය යටතේ වරදක් කරන සෑම පුද්ගලයකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු වූ පසු රුපියල් දස දහස නොඉක්මවන දඩයකට යටත් වේ.

අත්‍යවශ්‍ය සේවා

**10.** (1) පහත සේවා සම්බන්ධයෙන් නීත්‍යනුකූල රැකියාවක නිරත වන ඕනෑම පුද්ගලයෙකු ට:—

(අ) සෞඛ්‍ය සේවා;

(ආ) ජලය, විදුලිය හෝ සනීපාරක්ෂාව ඇතුළුව මහජන උපයෝගීතා සේවාවක් සැපයීම;

(ඇ) ඖෂධ නිෂ්පාදනය, ප්‍රවාහනය සහ බෙද හැරීම, සෞඛ්‍ය සේවා තාක්ෂණය සහ වෛද්‍ය - ශල්‍යකර්ම උපකරණ;

(ඈ) කෘෂිකාර්මික හා ආහාර භාණ්ඩ නිෂ්පාදනය, ප්‍රවාහනය සහ බෙදා හැරීම;

(ඉ) නීතිය බලාත්මක කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඊ) හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයකට මුහුණ දීම සඳහා ක්‍රියාත්මක වන ඕනෑම ක්‍රියාකාරකමක්,

මෙම පනතේ විධිවිධාන නොතකා එවැනි නීත්‍යනුකූල ඇකියාවක නිරත වීමට අවසර දෙනු ලැබේ.

(2) මෙම පනතේ 6 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සභාව විසින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ හෝ සේවා සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින කිසියම් ආයතනයක් පවත්වාගෙන යාම හෝ භාර ගැනීම සඳහා මූල්‍යමය සම්පත් ලබා දෙන ලෙස පාර්ලිමේන්තුවට නිර්දේශ කළ හැකි ය.

සෞඛ්‍ය අංශය

11. (1) *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙන් සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත උපදෙස් මත අමාත්‍යවරයාට එම නියෝගයේ දක්වා ඇති ආකාරයට පහත පරිදි ක්‍රියා කළ හැකි ය:—

(අ) පුද්ගලයන් නිරෝධායනය කිරීම සඳහා සුදුසු ආයතන නඩත්තු කිරීම හෝ ඉදිකිරීම;

(ආ) පුද්ගලයන්ට සෞඛ්‍ය සේවා සැපයීමේ අරමුණු සඳහා හෝ පුද්ගලයන් හෝ ද්‍රව්‍ය නිරෝධායනය කිරීම සඳහා සුදුසු ආයතනයක් ලෙස භාවිත කිරීම සඳහා, මෙම පනතේ 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති වාසස්ථාන හෝ නීත්‍යනුකූල ඇකියාවක් සඳහා භාවිත කරන පරිශ්‍රයන් හැර ඕනෑම පරිශ්‍රයක් ඉල්ලා සිටීම;

(ඇ) පුද්ගලයන්ට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා භාවිත කිරීමට පුද්ගලික රෝහලක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉල්ලා සිටීම;

(ඈ) පුද්ගලයන්ට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා භාවිත කරන රෝහල් සහ වෙනත් පරිශ්‍රයන්හි සේවයේ යෙදවීමට තාවකාලිකව සේවකයින් බඳවා ගැනීම:

එසේ වුව ද, එවැනි ඉල්ලීමක් හෝ තාවකාලික බඳවා ගැනීමක් බලපැවැත්විය යුත්තේ එම නියෝගයේ දක්වා ඇති කාල සීමාව සඳහා පමණක් වන අතර, එම කාල සීමාව හදිසි මහජන සෞඛ්‍ය කාල සීමාවෙන් ඔබ්බට දීර්ඝ නොවිය යුතු ය.

(2) (1) (ඇ) වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක ඍජු ප්‍රතිඵලයක් ලෙස පාඩු ලබන ඕනෑම පුද්ගලයකුට ඔහුගේ පරිශ්‍රය එවැනි ඉල්ලීමක්

ඉදිරිපත් කිරීමට පෙර තිබූ තත්ත්වයට හෝ යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය යැයි නිසි පරිදි තීරණය කරනු ලබන වන්දියක් ලබා ගැනීමට හිමිකම් ඇත.

(3) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා භාවිත කරන ඕනෑම පරිශ්‍රයකට ඇතුළු වීමට හෝ මෙම පනතේ 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නීත්‍යනුකූල ඊකියාවක් සිදු කරන හෝ පුද්ගලයන් නිරෝධායනය කරන පරිශ්‍ර පරීක්ෂා කිරීම පිණිස ඇතුළු වීමට අවසර දෙනු ලැබේ.

(4) මෙම පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව දක්වා ඇති බෝවන රෝගයෙන් එවැනි පුද්ගලයකුට ආසාදනය විය හැකි බවට පනතේ (3) වන උපවගන්තිය අනුව කරන ලද පරීක්ෂණයකට අනුව සෞඛ්‍ය පරීක්ෂකවරයකු සාධාරණ නිගමනයක් ඉදිරිපත් කරන්නේ නම් වෛද්‍ය පරීක්ෂණයකට හා ඉන් අනතුරුව නිරෝධායනය සඳහා ඕනෑම පුද්ගලයෙක් ඉදිරිපත් විය යුතු ය.

**12.** (1) ගැසට් පත්‍රයේ පළ කර ඇති නියෝගය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත උපදෙස් මත අමාත්‍යවරයාට පහත පරිදි ක්‍රියා කළ හැකි ය:—

(අ) වරාය, ගුවන්තොටුපල සහ වෙනත් පිවිසුම් ස්ථාන හරහා දින දහහතරකට නොඉක්මවන කාල සීමාවක් සඳහා පුද්ගලයින් ගමන් කිරීම හෝ ප්‍රවාහනය කිරීම තහනම් කිරීම හෝ සීමා කිරීම:

එසේ වුව ද, භාණ්ඩ ප්‍රවාහනය හෝ එවැනි භාණ්ඩ සංචරණ හෝ ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාරයේ හෝ ඊකියාවේ යෙදී සිටින ඕනෑම පුද්ගලයකුට එවැනි තහනමක් හෝ සීමාවක් අදාළ නොවේ;

(ආ) ස්ථානාධිපතිවරුන්, ගුවන් නියමුවන්, දුම්රිය කළමනාකරුවන් සහ වෙනත් පුද්ගලයින් සහ වරාය, ගුවන්තොටුපල සහ වෙනත් පිවිසුම් ස්ථානවල අයිතිකරුවන් හා කළමනාකරුවන් මත රාජකාරි පැනවීම;

(ඇ) වරාය, ගුවන්තොටුපල සහ වෙනත් පිවිසුම් ස්ථානවල සිටින පුද්ගලයින්ට ඔවුන්ගේ සෞඛ්‍යයට අදාළ තොරතුරු හෝ ප්‍රශ්න ඇතුළත් තොරතුරු සැපයීම හෝ පිළිතුරු සැපයීමට ඉල්ලා සිටීම.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ඕනෑම නියෝගයක් වහාම පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු අතර, එවැනි යෝජනාවක් මගින් එම නියෝගය අවලංගු කළ හැකි ය.

(3) යෝජනාවෙන් පාර්ලිමේන්තුවට (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයක් තවත් දින දහහතරකට නොඉක්මවන කාලයක් සඳහා දීර්ඝ කළ හැකි අතර, ඒ හා සමාන යෝජනාවලින් පසුව එම නියෝගය දින දහහතරකට නොවැඩි කාලයක් සඳහා දීර්ඝ කළ හැකි ය.

නිරෝධායන යනාදිය

13. (1) මෙම පනතේ 2 වන වගන්තිය යටතේ සම්මත කරන ලද යෝජනාවක නිශ්චිතව දක්වා ඇති රෝගයක් පැතිරීම වැළැක්වීමේ ඒකායන අරමුණ සඳහා නම් කරන ලද ඕනෑම පුද්ගලයකුට සාධාරණ ලෙස අවශ්‍ය පරිදි ක්‍රියා කළ හැකි ය:—

(අ) සුදුසු ආයතනයක පුද්ගලයකු හෝ දෙයක් හුදෙකලා හෝ නිරෝධායනයේ තබා ගැනීම;

(ආ) පුද්ගලයකු වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කිරීම;

(ඇ) පුද්ගලයකු රෝහලකට හෝ වෙනත් සුදුසු ආයතනයකට යොමු කිරීම;

(ඈ) පුද්ගලයකු රෝහලක හෝ වෙනත් සුදුසු ආයතනයක රඳවා තබා ගැනීම;

(ඉ) පුද්ගලයකු, දෙයක් හෝ පරිශ්‍රයක් විෂබීජහරණය කිරීම හෝ අපවිත්‍රතාවය ඉවත් කිරීම;

(ඊ) පුද්ගලයකු ආරක්ෂිත ඇඳුම් ඇඳීම;

(උ) පුද්ගලයකුගේ සෞඛ්‍ය හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳ තොරතුරු සැපයීම හෝ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම;

(ඌ) පුද්ගලයකුගේ සෞඛ්‍යය අධීක්ෂණය කිරීම සහ ප්‍රතිඵල වාර්තා කිරීම;

(එ) අනෙකුත් පුද්ගලයින්ට ආසාදනය වීමේ හෝ පැතිරීමේ අවදානම අවම කර ගත හැකි ආකාරය පිළිබඳව පුද්ගලයකු පුහුණු හෝ උපදෙස් සැසිවලට සහභාගි කරවීම;

(ඒ) පුද්ගලයකු සංචරණය වන්නේ කොතැනට ද යන්න සහ පුද්ගලයා හා සම්බන්ධතා ඇති අය පිළිබඳව සීමාවන් පැනවීම;

(ඔ) පුද්ගලයකු රැකියාවෙන් හෝ වෙළෙඳාමෙන් වැළකී සිටීම;

(ඕ) යම් දෙයක් අත්පත් කර ගැනීම හෝ රඳවාගැනීම;

(ක) මෘත දේහයක් සම්බන්ධයෙන්, දේහය භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම;

(ග) වෙනත් ඕනෑම අවස්ථාවක, යම් දෙයක් විනාශ කිරීම හෝ බැහැර කිරීම;

(ච) එම පරිශ්‍රයන් වසා දැමීමට කටයුතු කිරීම;

(ජ) සංවහනය හෝ චංචල ව්‍යුහයක් සම්බන්ධයෙන් එවැනි සංවහනය හෝ ව්‍යුහය රඳවා තබා ගැනීම;

(ට) ගොඩනැගිල්ලක්, සංවහනයක් හෝ ව්‍යුහයක් සම්බන්ධයෙන් එකී පරිශ්‍රය කඩා බිඳ දැමීමට කටයුතු කිරීම.

(2) සාධාරණ හේතුවක් නොමැතිව (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් පිළිපැදීමට අපොහොසත් වීමේ වරදක් සිදු කරන සෑම පුද්ගලයකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු වූ පසු රුපියල් දස දහස නොඉක්මවන දඩයකට යටත් වේ.

(3) *ගැසට් පත්‍රයේ* පළ කර ඇති නියෝගයෙන් අමාත්‍යවරයාට පුද්ගලයන් සහ ද්‍රව්‍ය නිරෝධායනය කිරීම සඳහා භාවිත කළ යුතු සුදුසු ආයතනවලට අනුකූල විය යුතු අවම ප්‍රමිතීන් නියම කළ හැකි ය.

**විශේෂ සහාය**

**14.** (1) මෙම පනතේ 6 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති සභාවේ උපදෙස් හා *ගැසට් පත්‍රයේ* පළ කර ඇති නියෝගය අනුව සමාජ සුභසාධන විෂයය භාරව කටයුතු කරන අමාත්‍යවරයා විසින් හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයක දී අසරණභාවයට පත්වීම හේතුවෙන් පනතේ 10 වන වගන්තියේ දක්වා ඇති භාණ්ඩ හා සේවාවන් වෙත ප්‍රවේශ විය නොහැකි පුද්ගලයින්ට එවැනි භාණ්ඩ හා සේවාවන් නොමිලේ හෝ නාමික පිරිවැයක් යටතේ ලබා ගැනීමට ප්‍රතිපාදන සැලසීම සහතික කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති සියලුම විධිවිධාන පිළිබඳ සතිපතා වාර්තාවක් අමාත්‍යවරයා සභාවට ඉදිරිපත් කළ යුතු ය.

**අධ්‍යාපන පරිශ්‍ර**

**15.** (1) *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගයෙන් අමාත්‍යවරයාට ඕනෑම අධ්‍යාපන පරිශ්‍රයක් තාවකාලිකව වසා දැමිය හැකි අතර, එය එම නියෝගයේ දක්වා ඇති කාලසීමාවක් සඳහා වලංගු වන අතර, එම නියෝගය හදිසි මහජන සෞඛ්‍ය කාලසීමාවෙන් ඔබ්බට දීර්ඝ නොකළ යුතු ය.

(2) කිසියම් අධ්‍යාපන පරිශ්‍රයක කළමනාකරණය හෝ පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු ඕනෑම අයෙකු (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයකට අනුකූල විය යුතු අතර, එම නියෝගයේ දක්වා ඇති කාල සීමාව සඳහා පුද්ගලයන් එවැනි පරිශ්‍රයන්ට නොපැමිණීම සහතික කිරීම සඳහා සාධාරණ පියවර ගත යුතු ය.

(3) *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙන් අමාත්‍යවරයාට එවැනි නියෝගයක නිශ්චිතව දක්වා ඇති අධ්‍යාපන පරිශ්‍ර තුළ සමකාලීන හෝ සමකාලීන ආශ්‍රිත ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතා හරහා සිසුන්ට ඉගැන්වීම් කටයුතු කිරීමට අදාළව ඕනෑම පාසලකට යොමු කළ හැකි වන අතර, එම කාල සීමාව හදිසි මහජන සෞඛ්‍ය කාල සීමාවෙන් ඔබ්බට දීර්ඝ නොකළ යුතු ය.

(4) (3) වැනි උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම පාසලකට එම නියෝගයට අනුකූල වීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් සහ මූල්‍ය සම්පත් ලබා දිය යුතු ය.

ශ්‍රමය

**16.** හදිසි මහජන සෞඛ්‍ය කාල සීමාව තුළ විශාල සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති ආරක්ෂිත කර්මාන්ත හෝ ආරක්ෂිත ක්ෂේත්‍රවල රැකියා කරන අය එම රැකියාවල රඳවා තබා ගැනීම සහතික කිරීම සඳහා පමණක් විශේෂ මූල්‍ය ආධාර ලබා ගැනීමේ අරමුණින් 'ආරක්ෂිත කර්මාන්ත' හෝ 'ආරක්ෂිත ක්ෂේත්‍ර' ලෙස පාර්ලිමේන්තු යෝජනාවකින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

නියෝග පළකිරීම

**17.** මෙම පනත යටතේ නිකුත් කරනු ලබන ඕනෑම නියෝගයක් පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවිය සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් මහජනයාට ලබා දිය යුතු ය.

රෝගියකුගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීම

**18.** මෙම පනතේ 5 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති බෝවන රෝගයකින් ආසාදනය වූ හෝ ආසාදිත වූ පුද්ගලයකුගේ අනන්‍යතාවය අයහපත් චේතනාවකින් හෙළි කරන ඕනෑම පුද්ගලයකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු වූ පසු රුපියල් පනස් දහස නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වෙනත් ලිඛිත නීතියක් අභිබවා මෙම පනතේ විධිවිධාන බලපැවැත්වෙන බව

**19.** වෙනත් ඕනෑම ලිඛිත නීතියක මීට පටහැනිව කුමක් සඳහන් වුව ද, මෙම පනතේ විධිවිධාන බලපැවැත්වෙනු ඇති අතර, ඒ අනුව, මෙම පනතේ විධිවිධාන සහ වෙනත් ලිඛිත නීතියක් අතර කිසියම් නොගැලපීමක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත්, එවිට මෙම පනතේ විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

අර්ථ නිරූපණය

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත්, මේ පනතේ-

"නම් කරන ලද පුද්ගලයා" යන්නෙන්, ඕනෑම නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියකු හෝ මෙම පනත යටතේ නිකුත් කරන ලද ඕනෑම නියෝගයකින් නියම කරන ලද වෙනත් පුද්ගලයෙක්;

"අධ්‍යාපන පරිශ්‍ර" යන්නෙන්,

(අ) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත යටතේ වූ රජයේ පාසලක්, සහය ලබන පාසලක් හෝ ආධාර නොලබන පාසලක්;

(ආ) 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ වූ වැඩිදුර අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති ආයතනයක්;

(ඇ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ වූ අධ්‍යාපනය හෝ පුහුණුව සපයන්නෙක්;

"සුදුසු ආයතනයක්" යන්නෙන්, මෙම පනතේ 5 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති බෝවන රෝගයක් හඳුනාගැනීම හෝ ඒවා අඩංගු කිරීම සඳහා සෘජුවම අදාළ වන වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා පුද්ගලයන්ට සෞඛ්‍යය සේවා සැපයීම සඳහා සාධාරණ ලෙස ප්‍රතිනිර්මාණය කළ හැකි ඕනෑම පරිශ්‍රයක්,

අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**21.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.